තේමාව - ජලය

විෂය - ප්‍රයෝගික තාක්ෂණ හා කුසලතා

පන්තිය - 6 ශ්‍රේණිය

පාඩම - පාත්තියක බෝග වවමු (ශාක වර්ධනයට ජලයේ වැදගත්කම)

අරමුණු -

- ජලයෙන් ඇති ප්‍රයෝජන නම් කරියි .
- ජලය දූෂණය හා එහි ප්‍රතිවිපාක ප්‍රකාශ කරයි.
- ජලය සම්පතක් බවත් එය රැකගැනීම අපගේ වගකීම බවත් ප්‍රයෝගිකව පෙන්වයි.
- පාඩමට අදාළ විෂය කරුණු ඉගෙන ගනියි.
-

..........................................................................................................................................................

01.පෙර ඉගෙනුම

- සරුබිමෙන් නෙළමු අපි අස්වනු පාඩම කියවා තේරුම් ගන්න.
- අපට ජලය ලැබෙන මූලාශ්‍ර හා ප්‍රයෝජන දැක්වෙන ලිපි එකතු කරන්න.
- ජලය දූෂණය වන ක්‍රම හා එයින් අපට සිදුවන විපාක පිළිබඳ ලිපි, ඇත පත්‍රිකා එකතු කරන්න.
- ජලය රැකගන්නා ක්‍රම පිළිබඳ තොරතුරු ගොනු කරන්න.

02.පන්ති කාමර ඉගෙනුම

I. පන්තියේ සිසුන් කණ්ඩායම් 04කට බෙදා

- පළමු කණ්ඩායම - ජලයෙන් ඇති ප්‍රයෝජන
- දෙවන කණ්ඩායම - ජල දූෂණ හා එහි විපාක
- තුන්වෙනි කණ්ඩායම - ජලය රැකගැනීම
- හතරවෙනි කණ්ඩායම - බෝග වගාවට ජලය වැදගත්වන ආකාරය

- ➢ එක් එක් කණ්ඩායමට අදාළ තොරතුරු ගොනුකරන්න.
- ➢ තොරතුරු කණ්ඩායම් අතර හුවමාරු කරගන්න.
- ➢ තොරතුරු පිළිබඳ සාකච්ඡා කරන්න.
- ➢ තොරතුරු පන්තියට ඉදිරිපත් කරන්න.

II. ගුරුවරයා අවශ්‍ය පරිදි අතිරේක පොත් හා තොරතුරු ක්‍රමවේද ලබාදෙමින් දරුවන් දිරි ගන්වයි.

සැකසුම - E M P නයනකාන්ති ඒකනායක ගුරු උපදේශක - කෘෂි විද්‍යා මාවනැල්ල කලාපය

03.පසු ඉගෙනුම

I. පන්තිය - තොරතුරු එක්රැස් කර බිත්ති පුවත්පතක් සකසා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරයි.
II. කණ්ඩායම් ක්‍රියාකාරකම - බෝග වගාව සඳහා පෙට්ටියක් ආකාරයට උස් පාත්තියක් නිර්මාණය කරයි.
III. කණ්ඩායම් ක්‍රියාකාරකම - ජලයෙන් පොගවගත් බීජ මූල සහිත බීජ හෝ පැල පාත්තියේ සිටුවයි.
IV. කේවල -
    - එක සිසුවෙකු එක් පැලය බැගින් අස්වනු නෙළන තුරු රැකබලාගැනීම.
      (ජලය හා පොහොර යෙදීම,වල් මර්දනය, පස් ලංකිරීම)
    - දූෂිත ජලය යෙදීමෙන් රෝග වැළදෙන බව ප්‍රයෝගිකව පෙන්වයි.
    - අස්වනු නෙලන තුරු ජලයේ අවශ්‍යතාවය ප්‍රයෝගිකව පෙන්වයි.

V. පොදු -
    - ජලය දූෂණය වන ක්‍රම, එහි විපාක හා ජාල සම්පත සුරැකීම පිලිබඳව වීදි නාට්‍යයක් රග දැක්වීම.

04.පාඩම ඉගෙනීම සඳහා අවශ්‍ය සහය ලබාගතහැකි මුද්‍රිත, ශ්‍රව්‍ය , දෘෂ්‍ය , Online මාධ්‍ය ( WEB පිටු හා සබඳතා)

I. YouTube
II. සොබාකෙත
III. ඉරිදා පෙ.ව 7.30 ජාතික රූපවාහිනිය - රිවිදිනට අරුණැල්ල